සැ. යු. - 2010.11.12 දින පළ වූ අංක 1,680 දරන ගැසට් පත්‍රයේ I- III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,681 - 2010 නොවැම්බර් මස 19 වැනි සිකුරාදා - 2010.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 2072 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 2074 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 2079 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 නොවැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


2071- B 080172—8,845 (2010/11)

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - නුගේගොඩ**

නඩු භාණ්ඩ වෙන්දේසිය - 2010

නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2010.12.04 වැනි දින පෙරවරු 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙරවරු 9.30 සිට 10.00 දක්වා භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. භාණ්ඩ ගැනුම්කරු ඔහුගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

එච්. එම්. ආර්. අනුර කුමාර,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
නුගේගොඩ.

2010 නොවැම්බර් මස 01 වැනි දින,
නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**භාණ්ඩ විස්තරය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | බී/3318/08 | වානේ මේස 01 |
| 02. | එම | ටෙලිපෝන් 01 |
| 03. | එම | වානේ අල්මාරි 01 |
| 04. | එම | ලී මේස 04 |
| 05. | එම | පරිගණක මේස 01 |
| 06. | එම | වානේ කබඩ් 01 |
| 07. | එම | ලී මේස 01 |
| 08. | එම | ලී මේස 01 |
| 09. | එම | වානේ කබඩ් 01 |
| 10. | එම | ලී මේස 01 |
| 11. | එම | වානේ කබඩ් 01 |
| 12. | එම | ෆැක්ස් ටෙලිෆෝන් 01 |
| 13. | එම | ටෙලිෆොන් 01 |
| 14. | එම | වානේ ලිපිගොනු අල්මාරි 01 |
| 15. | එම | වානේ කබඩ් 02 |
| 16. | එම | කුෂන් පුටු (කුඩා) 04 |
| 17. | එම | වානේ කබඩ් 02 |
| 18. | එම | වානේ මේස 01 |
| 19. | එම | දුඹුරු පැහැ කුෂන් පුටු 03 |
| 20. | බී/3318/08 | දුඹුරු පැහැ කුෂන් පුටු යකඩ 36 |
| 21. | එම | කැරකෙන ප්ලාස්ටික් කුෂන් පුටු 04 |
| 22. | එම | ප්ලාස්ටික් ඇඳි පුටු 09 |
| 23. | එම | ප්ලාස්ටික් පුටු (ඇඳි නොමැති) 21 |
| 24. | එම | යකඩ මේස 01 |
| 25. | එම | වානේ මේස 02 |
| 26. | එම | වානේ මේස 01 |
| 27. | එම | යකඩ කබඩ් 02 |
| 28. | එම | යකඩ මේස 02 |
| 29. | එම | ලී මේස 01 |
| 30. | එම | යකඩ මේස 01 |
| 31. | එම | වානේ කබඩ් 01 |
| 32. | එම | ලී බංකු 08 |
| 33. | එම | විධායක පුටු 34 |
| 34. | එම | ලී අල්මාරි 01 |
| 35. | එම | යකඩ රතු පුටු 04 |
| 36. | එම | යකඩ ඇඳි පුටු 10 |
| 37. | එම | ලී මේස (කුඩා) 01 |
| 38. | එම | වයිට් බෝඩ් 01 |
| 39. | එම | පිළිගැනීමේ මේස 01 (කොටස් වශයෙන් කැඩී ඇත) |
| 40. | එම | ප්ලාස්ටික් පුටු (ඇඳි සහිත) 02 |
| 41. | එම | ස්ටූල් 01 |
| 42. | එම | ප්ලාස්ටික් පුටු 01 |
| 43. | එම | සෝපා පුටු 01 |
| 44. | එම | පරිගණක මේස 03 |
| 45. | එම | වානේ මේස 01 |
| 46. | එම | ලී මේස 01 |
| 47. | එම | ලී අල්මාරි 01 |
| 48. | එම | සෝපා සෙට් 02 |
| 49. | එම | ටී. වී. ස්ටෑන්ඩ් 01 |
| 50. | එම | විධායක පුටු 01 |
| 51. | එම | රතුපාට ඇඳි සහිත යකඩ පුටු 03 |
| 52. | එම | කලුපාට සෝපා පුටු 01 |
| 53. | එම | ලී අල්මාරි 01 |
| 54. | එම | ලී මේස 07 |
| 55. | එම | විධායක පුටු 11 |
| 56. | එම | ලී රාමු 01 |
| 57. | එම | වානේ අල්මාරි 02 |
| 58. | එම | යකඩ මේස 02 |
| 59. | එම | යකඩ පෙට්ටි 01 |
| 60. | එම | W. P. M. G. – 1248 බජාජ් යතුරු පැදිය |
| 61. | එම | W. P. M. H. – 0657 බජාජ් යතුරු පැදිය |
| 62. | එම | W. P. M. H. – 0660 බජාජ් යතුරු පැදිය |
| 63. | එම | W. P. M. P. – 6372 යතුරු පැදිය |
| 64. | එම | W. P. M. P. – 6373 යතුරු පැදිය |
| 65. | එම | W. P. M. P. – 6376 යතුරු පැදිය |
| 66. | එම | W. P. M. P. – 6377 යතුරු පැදිය |
| 67. | එම | W. P. M. P. – 6378 යතුරු පැදිය |
| 68. | එම | W. P. M. P. – 6379 යතුරු පැදිය |
| 69. | එම | W. P. M. P. – 6380 යතුරු පැදිය |
| 70. | එම | W. P. M. P. – 6383 යතුරු පැදිය |
| 71. | එම | W. P. M. P. – 6385 යතුරු පැදිය |
| 72. | එම | W. P. M. P. – 6390 යතුරු පැදිය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 73. | බී/3318/08 | W. P. M. P. – 8015 යතුරු පැදිය |
| 74. | එම | W. P. T. D. – 8020 යතුරු පැදිය |
| 75. | එම | W. P. T. D. – 8022 යතුරු පැදිය |
| 76. | එම | W. P. T. D. – 8025 යතුරු පැදිය |
| 77. | එම | W. P. T. D.– 8029 යතුරු පැදිය |
| 78. | එම | W. P. T. D. – 8037 යතුරු පැදිය |
| 79. | එම | W. P. T. D. – 8044 යතුරු පැදිය |

11-499

---

## පොලිස් දෙපාර්තමේන්තුව - මීගමුව කොට්ඨාසය

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ මීගමුව පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් ස්ථානවල පාවිච්චි කර ගර්හිත කරන ලද පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2010 දෙසැම්බර් මස 01 වැනි දින පැය 9.30 ට මීගමුව පොලිස් අධිකාරි කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ.

2010 නොවැම්බර් මස 30 වැනි දින පැය 13.00 සිට පැය 16.00 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි භූමියට ඇතුලුවන සියළුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුයි.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතුයි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්).

වෙන්දේසියෙන් මිලදී ගනු ලැබූ භාණ්ඩ 2010 දෙසැම්බර් මස 01 දින පැය 16.00 ට පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩල විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

එස්. චන්දන ගලප්පත්ති,
පොලිස් අධිකාරී,
මීගමුව කොට්ඨාසය.

### උපලේඛනය

| අනු. අංකය | භාණ්ඩ විස්තරය | පිටුව | ප්‍රමාණය (එස් අක්ෂරය යෙදූ) |
|---|---|---|---|
| 1. | විසිකැති | 20 | 01 |
| 2. | හිරමන | 20 | 01 |
| 3. | විල් බැරෝ | 20 | 01 |
| 4. | සිවිලින් පැන් තටු | 20 | 03 |
| 5. | යකඩ පුටු | 21 | 18 |
| 6. | ටී. වී වර්ණ | 21 | 02 |
| 7. | මේස විදුලි පංකා | 21 | 04 |
| 8. | යතුරු ලියන සිංහල (ගොඩ්රිච්) | 21 | 02 |
| 9. | කැල්කියුලේටර් | 21 | 15 |
| 10. | යකඩ ඉනි | 22 | 01 |
| 11. | විදුලි කේතල | 22 | 02 |
| 12. | ටියුබ් ලයිට් සෙට් | 22 | 01 |
| 13. | පරණ සවල් | 22 | 01 |
| 14. | ඉංග්‍රීසි යතුරු ලියන (පැසික්) | 22 | 01 |
| 15. | උදළු තල පරණ | 22 | 01 |
| 16. | වතුර පිල්ටර් පරණ | 28 | 04 |
| 17. | බාල්දි ගැල්වනයිස් | 28 | 02 |
| 18. | පරණ පාපැදි | 30 | 04 |
| 19. | පරිඝනක මොනිටර් | 30 | 02 |
| 20. | 7 x 4 අඩි 05 කෑලි | 31 | 01 |
| 21. | 7 x 4 අඩි 08 කෑලි | 31 | 01 |
| 22. | 7 x 4 අඩි 11 කෑලි | 31 | 02 |
| 23. | 7 x 4 අඩි 07 කෑලි | 31 | 02 |
| 24. | 7 x 4 අඩි 10 කෑලි | 31 | 01 |
| 25. | 6 x 4 අඩි 13 කෑලි | 31 | 02 |
| 26. | 6 x 4 අඩි 11 කෑලි | 31 | 02 |
| 27. | 6 x 4 අඩි 14 කෑලි | 31 | 01 |
| 28. | 6 x 4 අඩි 09 කෑලි | 31 | 02 |
| 29. | 6 x 4 අඩි 15 කෑලි | 32 | 01 |
| 30. | 6 x 4 අඩි 10 කෑලි | 32 | 03 |
| 31. | 8 x 2 2/1 අඩි 7 කෑලි 32 | 32 | 02 |
| 32. | 8 x 2 2/1 අඩි 17 කෑලි | 32 | 01 |
| 33. | 8 x 2 2/1 අඩි 21 කෑලි | 32 | 02 |
| 34. | 8 x 2 2/1 අඩි 20 කෑලි | 32 | 02 |
| 35. | 8 x 2 2/1 අඩි 18 කෑලි | 32 | 01 |
| 36. | 6 x 2.2 අඩි 22 කෑලි | 32 | 01 |
| 37. | 8 x 3 අඩි 20 කෑලි | 32 | 01 |
| 38. | 7 x 4 අඩි 08 කෑලි | 33 | 01 |
| 39. | 6 x 4 අඩි 10 කෑලි | 33 | 01 |
| 40. | 6 x 4 අඩි 12 කෑලි | 33 | 01 |
| 41. | 6 x 4 අඩි 14 කෑලි | 33 | 01 |
| 42. | 5 x 2 2/1 අඩි 15.6 කෑලි | 33 | 30 |
| 43. | 15. x 2. 2/1 අඩි 9.6 කෑලි | 33 | 10 |
| 44. | 15 x 2 2/1 අඩි 13 කෑලි | 33 | 30 |
| 45. | 15 x 2 2/1 අඩි 07 කෑලි | 33 | 10 |
| 46. | 5 x 2 2/1 අඩි 5.6 කෑලි | 33 | 20 |
| 47. | 5 x 2 2/1 අඩි 4 කෑලි | 34 | 02 |
| 48. | 5 x 2 2/1 අඩි 3 කෑලි | 34 | 05 |
| 49. | උළු කැට | 34 | 3200 |
| 50. | මේන් ස්විච් | 34 | 02 |
| 51. | විදුලි පංකා සිවිලින් | 35 | 19 |
| 52. | විදුලි පංකා තටු නැති | 35 | 01 |
| 53. | ටියුබ් ලයිට් සෙට් | 35 | 25 |
| 54. | වතුර මෝටර් | 29 | 01 |
| 55. | කුඩා යකඩ කබඩ් | 29 | 01 |
| 56. | කබඩ් | 22 | 03 |

11-442

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතෙහි 9 (2) වගන්තියට අනුව, පහත සඳහන් සමාගමෙහි නම 2010 ඔක්තෝබර් මස 14 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ පැරණි නාමය : ටී එම් ඉන්ටර්නැෂනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 115
සමාගමේ ලියාපදිංචි කළ
කාර්යාලයීය ලිපිනය : අංක 475, යුනියන් පෙදෙස, කොළඹ 2
සමාගමේ නව නාමය : ආසිආටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

සමාගම් ලේකම්,
ආසිආටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

2010 නොවැම්බර් මස 03 වැනි දින.

11-557

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :

1. සමාගමේ නම : සීමාසහිත ඉළුඹකන්ද මිළිඳුතලාව සදාහරිත ගමනැගුම ජනතාසමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3882
3. සංස්ථාගත කළ දිනය : 2010.09.27
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ගමනැගුම කාර්යාලය, මිළිඳුතලාව, ගාලවත්ත, පොතුපිටිය.

සමාගමේ ලේකම්.

11-560

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් දන්වමි :

සමාගමේ නම : යුනිප්‍රින්ට් මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 73017
ලියාපදිංචි කාර්යාලය : අංක 7/86, කපුවත්ත, පාසැල් මාවත, ගංගොඩවිල, නුගේගොඩ.

අධ්‍යක්ෂවරු.

11-390

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව ඒ වන් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2010 ඔක්තෝබර් මස 21 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඒ වන් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 75049
ලියාපදිංචි දිනය : 2010 ඔක්තෝබර් මස 21 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 140/1, ගාලු පාර, දෙහිවල (දකුණ).

සමාගම් අධ්‍යක්ෂ.

11-514

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව සැවේන් ට්‍රැවල්ස් ඇන්ඩ් ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී 2010 මැයි 12 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සැවේන් ට්‍රැවල්ස් ඇන්ඩ් ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 72275
ලියාපදිංචි දිනය : 2010 මැයි මස 12 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 26/03/18, තුන්වන මහල, මෙට්‍රො සෙන්ට්‍රල් ගොඩනැගිල්ල, අතුරුගිරිය පාර, මාලබේ.

සමාගම් අධ්‍යක්ෂ.

11-513

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව ටිපිකල් ලංකා ඉන්ටනැෂනල් (පීවීටී) එල්ටීඩී 2010 සැප්තැම්බර් මස 30 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ටිපිකල් ලංකා ඉන්ටනැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 74607
ලියාපදිංචි දිනය : 2010 සැප්තැම්බර් මස 30 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 19 ඒ, අවිස්සාවේල්ල පාර, කඩුවෙල.

සමාගම් අධ්‍යක්ෂ.

11-515

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

මධු නදී ඉන්ටනැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් 2010.10.18 වැනි දින අංක පී. වී. 74960 යටතේ සංස්ථාගත කරන ලදී.
ලියාපදිංචි ලිපිනය : අංක 14/10, පතන්වල, දෙල්ගොඩ.

11-428

---

### ඇනිලානා ප්‍රොපටීස් (ප්‍රයිවේට්) ලිමිටඩ් නිවේදනය

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර ඇනිලානා ප්‍රොපටීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ නම පහත සඳහන් ආකාරයට වෙනස් කර ඇති බව මහජනයා වෙත දැනුම් දෙනු ලැබේ.

කලින් භාවිතා කළ නම : ඇනිලානා ප්‍රොපටීස් (ප්‍රයිවේට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංකය : පී වී 72355
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 6/1, නිදහස් මාවත, කොළඹ 7
සමාගම දැන් භාවිතා කරන නම : ඇනිලානා ප්‍රොපටීස් ලිමිටඩ්.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
ලේකම්වරු ඇනිලානා ප්‍රොපටීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

11-394

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පස්යාල, කලල්පිටිය, මැදලන්ද වත්ත, අංක 20 ඒ හි පදිංචිව සිටි කංකානම් ආරච්චිගේ විමාලි සමන්තා සමරතුංග වන මා විසින් පස්යාල, කලල්පිටිය මැදලන්ද වත්ත, 20 ඒ හි පදිංචි දොඹේපොල ආරච්චිගේ චාර්ලට් ලීලාරත්න දොඹේපොල වන අය වෙත බලය පවරන ලද 2005.03.07 වැනි දින නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. ඒ. සී. ඩී. රණවක විසින් සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් පවරන ලද බලය මෙයින් අවලංගු කරනු ලැබේ.

එසේ හෙයින් විශේෂ ඇටර්නි බලපත්‍රය යටතේ කරනු ලබන සියලුම ක්‍රියාවන් පිළිබඳව 2010.11.01 වැනි දින සිට බලපාන පරිදි මාගේ කිසිදු වගකීමක් නොමැති බව මෙයින් වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

කංකානම් ආරච්චිගේ විමාලි සමන්තා සමරතුංග.

11-448

---

### ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත පාර අංක 91 දරන ස්ථානයේ පදිංචි රත්නායක මුදියන්සේලාගෙදර කරුණාවතී වන මා දිවයිනෙන් බැහැර යෑමට පෙර මා විසින් 2010 අගෝස්තු මස 31 වැනි දින අජිත් රෝහාන් ධර්මප්‍රේම ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් සහතික කළ අංක 6073 දරන ඇටර්නි බලකරය මත මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් හඟුරන්කෙත, පිලපිටිය නිවස, අංක 35 දරන ස්ථානයේ පදිංචි තිලකරත්න මුදියන්සේලා සෝමරත්න යන අය පත්කළ බවත් නැවත මා පෙරලා දිවයිනටම පැමිණ ඇති බැවින් එකී අංක 6073 දරන ඇටෝර්නි බලකරය මෙයින් අවලංගු කර බල රහිත කරන බවත් මින් ඉදිරියට එකී ඇටෝර්නි බලකර මගින් මගේ ක්‍රියාවෙන් කිසිදු කටයුත්තක් නොකළ හැකි බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනාටම දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

11-502

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ සාරසියපත්තුවේ කුලුගම්මනසියපත්තුවේ වැරැල්ලගම තිත්තපජ්ජල හෙළසෙවන යන ලිපිනයෙහි පදිංචි වෙඩික්කාර ගෙදර ප්‍රේමරත්න සහ එම ලිපිනයේ ම පදිංචි චාලට් රම්මුණිගේ වන අපි, 2007ක් වූ නොවැම්බර් මස 24 වැනි දින පොලොන්නරුවේ ප්‍රසිද්ධ නොතාරිස් මාපාහාමිලාගේ උදේනි දමින්ද රුවන් කුමාර මාපා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 205 දරන ඇටෝර්නි බලපත්‍රයේ නම සඳහන් ඇටෝර්නි බලකාරිය වන එකී වැරැල්ලගම තිත්තපජ්ජල හෙළසෙවන යන ලිපිනයෙහි පදිංචි වෙඩික්කාර ගෙදර බුද්ධිකා සංජීවනී ප්‍රේමරත්න වෙත දෙනු ලැබූ ඇටෝර්නි බලය අවලංගු හා බලරහිත කරන බව සියලුදෙනා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. මින් ඉදිරියට අප වෙනුවෙන් ඇය විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට අප වගනොකියන බව මෙයින් දැනගත යුතු වේ.

වෙඩික්කාර ගෙදර ප්‍රේමරත්න,
චාලට් රම්මුණිගේ.

2010 ඔක්තෝබර් මස 08 වැනි දින.

11-503

---

### ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 04, ද ෆොන්සේකා පෙදෙසේ, අංක 7/3 ඒ යන ස්ථානයේ හා දැනට කොළඹ 03 රජිනි පාරේ ක්වීන්ස් කෝට් හි අංක 226/3 හි පදිංචි සජු රමේෂ් තුල්සිදාස් වන මා විසින්, ප්‍රසිද්ධ නොතාරිස් වී. බාලසුබ්‍රමනියම් යන අය විසින් සහතික කරන ලද, කොළඹ 04, ද ෆොන්සේකා පෙදෙසේ, අංක 7/3 හි ප්‍රකාශ් තුල්සිදාස් යන අය වෙත පවරන ලද 2006 ජුනි 03 වැනි දිනැති අංක 3649 දරන ඇටර්නි බලපත්‍රය මෙම දිනයේ පටන් ක්‍රියාත්මක වන පරිදි, අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

සජු රමේෂ් තුල්සිදාස්.

කොළඹ දී ය.

11-580

---

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

මෙහි පහත අත්සන් තබන ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල, මීගමුව පාර, නිල්මිණි, අංක 441 හි පදිංචි ජයවික්‍රමගේ දොන් නුවන් රූපසිංහ වන මා විසින් බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල, මාබෝල බන්ගලාවත්ත ඕවිට මාවත අංක 7 හි පදිංචි වල්පිට ගමගේ ජනක දිලීප් කුමාර යන අයට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ලාල් වික්‍රමසිංහ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1961 සහ 2006.08.07 දින දරන ඇටෝර්නි බලපත්‍රය අද දින පටන් බලපාන පරිදි අවලංගු කර විසුරුවා හරින බවත්, අද දින සිට එකී ඇටෝර්නි බලපත්‍රයේ ඔහුට ලබා දී ඇති බලය අවලංගු කරන බවට ලංකාවේ පුරවැසියන්ට මෙයින් දැනුම් දෙමි. මෙම ඇටෝර්නි බලපත්‍රය කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ 343 පොතේ 39 පත් ඉරුවේ 14325 ඡේදය යටතේ ලියාපදිංචි කර ඇති බවත් ය.

ඉහත කී අංක 1961 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත නම් සඳහන් වල්පිට ගමගේ ජනක දිලීප් කුමාර නමැති අය විසින් අද දින සිට කරනු ලබන කිසිදු ගණුදෙනුවකට හෝ කටයුතුවලට මා වගකීම් භාර නොගන්නා බවට මෙයින් දන්වා සිටිමි.

ජයවික්‍රමගේ දොන් නුවන් රූපසිංහ.

2010 නොවැම්බර් මස 04 වැනි දින.

11-590

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පැල්මඩුල්ල ඉද්දමල්ගොඩ පන්සල අසල අංක 10 හි පදිංචි බෝපගේ සුදත් නුගඇල සහ පතිනාගොඩගේ ලිනෝල්ඩ් අරුණශාන්ති වන අප විසින් මාකොළ, මාකොළ දකුණ, සිරිමංගල පාර අංක 150 හි පදිංචි පතිනාගොඩගේ ජයසේන වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සහ නීතිඥ ජේ. ජයවික්‍රම විසින් සහතික කරන ලද අංක 67 සහ 1999.06.14 දින දරන ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කොට අහෝසි කොට අවලංගු කරන ලද බව පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

මෙම දැනුම්දීමෙන් පසු මාගේ ඇටෝර්නි බලකරු විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රයෙන් මා විසින් පවරන ලද බලය මත මා වෙනුවෙන් කරනු ලබන කවර හෝ ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මෙදින සිට මා වගකීම නොදරන බව ද ප්‍රකාශ කර සිටිමි.

බෝපගේ සුදත් නුගඇල,
පතිනාගොඩගේ ලිනෝල්ඩ් අරුණශාන්ති.

2010 නොවැම්බර් මස 01 වැනි දින.

11-393

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කිඹුලාපිටිය ගල්මංකඩ අංක 52 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 585722855 V හිමි පල්ලගේ ස්ටෙලා සරෝජනී හෙවත් ස්ටෙලා සරෝජනී ද සිල්වා වන මම, ජාතික හැඳුනුම්පත් අංක 847213957 V හිමි මල්ලිකා ආරච්චිලාගේ ප්‍රියන්ති හැවනෙගෙදර, මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කළ 2008 දෙසැම්බර් මස 12 වැනි දින මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. ඒ. එම්. පියුමලී අධිකාරි විසින් ලියා සහතික කරන ලද අංක 29 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරුට දී ඇති අයිතිවාසිකම් බලපුලුවන්කම් සහ විශේෂ බලතල 2010 ඔක්තෝබර් මස 24 වැනි දින සිට බලරහිත හා ශූන්‍ය වන බව ප්‍රකාශ කරමි.

පල්ලගේ ස්ටෙලා සරෝජිනී,
ඇටෝර්නි බලකරු.

11-497

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 4/1 ඩී 3, ගැමුණු මාවත, අත්තිඩිය දෙහිවල හි පදිංචි ෆාතිමා ඉල්මා ඉක්බාල් විසින් අංක 4/1 ඩී 3, ගැමුණු මාවත, අත්තිඩිය, දෙහිවල හි පදිංචි සිත්ති සරීනා බුහාර්ඩීන් වෙත දෙනු ලැබූ අංක 1204 හා වර්ෂ 2009 ජනවාරි මස 28 වැනි දින දරන මාබෝල හි ප්‍රසිද්ධ නොතාරිස් වරුණි එම්. ඊ. ගුණවර්ධන සහතික කළ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර බලශූන්‍ය හා ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද, ඉහත කී සිත්ති සරීනා බුහාර්ඩීන් විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමට යටත් නොවන බව ද දැනුම් දෙනු ලැබේ.

ෆාතිමා ඉල්මා ඉක්බාල්.

11-498

## ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම

මුල්ලේරියාව නව නගරයේ රුවන්පුර අංක 63/500 හි පදිංචි හෙට්ටිආරච්චිගේ පීටර් ජෝන් අර්නස්ට් පෙරේරා වන මම, මහජනයාට දන්වා සිටින වගනම්, ඉහත කී ලිපිනයෙහි ම පදිංචි ප්‍රීති ලක්ෂ්මන් පරාක්‍රම පෙරේරා සහ නැසීගිය හෙට්ටිආරච්චිගේ මාග්‍රට් පෙරේරා යන අයට බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. ස්ටෙම්බො විසින් ලියා සහතික කරන ලද අංක 515 සහ 1991.06.12 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2010 ක් වූ නොවැම්බර් මස 02 වැනි දින සිට අවලංගු සහ බලරහිත වන බව ද, ඔහු විසින් ඇතුළත් වනු ලබන කිසිදු ගණුදෙනුවකට බල පැවැත්මක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

හෙට්ටිආරච්චිගේ පීටර් ජෝන් අර්නස්ට් පෙරේරා.

11-430

## දැන්වීමයි

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ගමගේ දීපානි සුධර්මා විජේසේකර මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 4960 සහ වර්ෂ 2010.04.28 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් එහි ඇටෝර්නි අධිපති කිරිබත්ගොඩ, රෝහල පාර, විටෝ මාවත, අංක 275/6 ලිපිනයේ පදිංචි දොන් නිහාල් පුෂ්ප කුමාර වෙහෙරගම (ජාතික හැඳුනුම්පත් අංක 691012760 V) විසින් කඳාන, රිලවුල්ල අංක 69/10 ලිපිනයේ පදිංචි සජිත් නානායක්කාර (ජාතික හැඳුනුම්පත් අංක 673390285 V) වන මා ඇටෝර්නි බලකරු ලෙස පත් කර ඇති අතර එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර බලරහිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

11-445

## 2007 අංක 07 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මහජනතාව වෙත කරනු ලබන දැන්වීමයි

ලියාපදිංචි අංක පී වී 73053 දරන අංකය යටතේ 2010 ජූලි මස 07 වැනි දින ලියාපදිංචි කරන ලද ඩී ඇන්ඩ් ඩී හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ තොරතුරු පහත පරිදි වේ.

*(අ)* සමාගමේ නාමය : ඩී ඇන්ඩ් ඩී හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
*(ආ)* ලියාපදිංචි අංකය : පී වී 73053
*(ඇ)* ලියාපදිංචි ලිපිනය : අංක 43/115, පූර්වාරාම පාර, කොළඹ 05.

11-452

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බවට මහජනයා වෙත කරනු ලබන දැන්වීමයි :-

සමාගමේ නම : මිලර්ස් බෲවරි ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී බී 3880
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 40, යෝක් වීදිය, කොළඹ 01
සංස්ථාගත කළ දිනය : 2010 සැප්තැම්බර් මස 27 වැනි දින.

සමාගම් ලේකම්.

11-449

**ක්ලීන්කෝ ලංකා ලිමිටඩ්**

කලින් ක්ලීන්කෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

(සමාගම් ලියාපදිංචි අංකය පී. වී/60768/PB)

***නාමය වෙනස් කිරීම පිළිබඳ වූ ප්‍රසිද්ධ දැන්වීම***

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර 2010 ඔක්තෝබර් මස 25 දිනැති විශේෂ යෝජනාවකට නීතියෙහි ආනුෂංගිකව 8 සහ 28 වැනි වගන්ති සමග කියවෙන 2007 අංක 7 දරන සමාගම් පනතේ 11 (1) වගන්තියෙහි විධිවිධානයන්ට අනුකූලව ක්ලීන්කෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (කලින් නාමය) යන නාමය ක්ලීන්කෝ ලංකා ලිමිටඩ් වශයෙන් (අලුත් නාමය) වෙනස් කර ඇති බව අපි මහජනතාවට මෙයින් දැනුම් දෙමු. සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය, අක්බාර් බ්‍රදර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බාරේ, අංක 334, ටී. බී. ජයා මාවත, කොළඹ 10 වේ.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂ/ලේකම්.
එම් සහ එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල, (5 වැනි තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

11-400

---

**මහජනතාව වෙත දැනුම් දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2010 ඔක්තෝබර් මස 13 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ලලාන් එකෝ - ලේටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 74872
ලියාපදිංචි කාර්යාලය : අංක 18, නාවල පාර, නුගේගොඩ.

එස්. ජේ. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්වරුන්.

2010 ඔක්තෝබර් මස 13 වැනි දින,
04 වැනි මහල, අංක 02, කාසල් පටුමග,
කොළඹ 04.

11-395

---

**සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීම**

පී. වී. අංක 1765 දරන එච්වීජ් ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයෙහි නාමය 2010 සැප්තැම්බර් මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්වීජ් ෆුඩ්ස් ලිමිටඩ් ලෙස වෙනස් කිරීම සඳහා එකී සමාගමෙහි යෝජනාව පිළිබඳව 2007 අංක 7 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

11-396

**2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 වගන්තිය යටතේ කරනු ලබනු දැනුම් දීම**

වර්ෂ 2010.10.01 දින ගෝනවිද්දගල ඇග්‍රෝ ෆාම් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සමාගමක් කොළඹ 08, ගෝතමී පාර, සන්ෂයින් කෝට්, අංක 65/18 හි සංස්ථාගත කර ඇති බවත් එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 74649 බවත් ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. විජිත මනම්පේරි,
සමාගම් ලේකම්.

11-431

---

**දැන්වීමයි**

සීමාසහිත ලංකා ඔරික්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස්හි කොටස්කරු විසින් 2010 ඔක්තෝබර් 25 වැනි දින සම්මත කරගත් පරිදි එම සමාගම එදින සිට වසා දැමීමට තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

සී. එස්. එමානුවෙල්,
සමාගම් ලේකම්.

2010 ඔක්තෝබර් මස 26 වැනි දින,

11-432

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ පහත සමාගම ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම : සෙරිස්ටාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලි. ප. අංකය : PV65211 දිනය : 2008.08.19
ලිපිනය : අංක 57, සාන්ත රීටා පාර, ගල්කිස්ස.

ඩබ්. ඩී. ප්‍රභාත් ෆොන්සේකා,
අධ්‍යක්ෂ.

11-599

---

**සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : කිනැම් රිසෝට්ස් ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී බී 3909
ලියාපදිංචි කාර්යාලය : 120, බුලර්ස් පාර, 5/4, සීගල් කෝට්ස්, කොළඹ 03.

කිනැම් රිසෝට්ස් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

එම්. ඩී. පී. එස්. කරුණානායක,
සමාගමේ ලේකම්.

11-585

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2010 ඔක්තෝබර් මස 27 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : මැද්දෙගෙදර ටී ඇන්ඩ් රබර් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පීවී 75127

ලියාපදිංචි කාර්යාලය : "කුසුම් ශ්‍රී", අංක 08, ඩී. සිල්වා මාවත, ඇටඹගොඩ, පානදුර.

එස්. ජේ. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

2010 ඔක්තෝබර් මස 27 වැනි දින,
04 වැනි මහල,
අංක 02, කාසල් පටුමග,
කොළඹ 04.

11-501

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොච්චිකඩේ හලාවත පාර අන්තොපිතා ට්‍රේඩ් සෙන්ටර් අංක 117 හි පදිංචි ජා.හැ.ප.අංක 851093540 V දරන මිරිසගේ නුවන් සුදේශ් ප්‍රනාන්දු වන මා ජාඇල කොටුගොඩ, නිවාසිපුර එස් 53 පදිංචි ජා.හැ.ප.අංක 620814113 V දරන වැන් ෆූලින් යන අයගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කරමින් සුරංගා ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස්තැන 2010.09.30 වැනි දින ලියා සහතික කළ අංක 4485 දරන ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගුකොට බලරහිත කළ බවත්, එකී ඇටර්නි බලපත්‍රය මගින් ලද බලය පිට මා විසින් එකී වැන් ෆූලින් යන අය වෙනුවෙන් පෙනී සිට අද දින පටන් කිසිදු ගණුදෙනුවක් හෝ ක්‍රියාවක් සිදු නොකරන බවත්, ශ්‍රී ලංකා ජනරජයට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මිරිසගේ නුවන් සුදේශ් ප්‍රනාන්දු.

2010 ඔක්තෝබර් මස 19 වැනි දින.

11-380

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම පිළිබඳ දැනුම් දීම

ජාඇල වැලිගම්පිටිය උසාවිය පාරේ 2 වැනි පටුමගෙහි අංක 11/එෆ් හි පදිංචි වසුදා ලවන්ගි ගුණසේන හෙවත් වසුදා ලවන්ගි ඥාණසිරි වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මේ මගින් දැනුම් දෙනු ලබන්නේ මා විසින් ජාඇල වැලිගම්පිටිය උසාවිය පාරේ 2 වැනි පටුමගෙහි අංක 11/එෆ් හි පදිංචි ගම්මික රසල් ගුණසේන යන අයට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. එෆ්. ෂහාබ්දීන් විසින් 2008 ජනවාරි මස 01 වැනි දින ලියා සහතික කරන ලද අංක 472 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු, බලරහිත සහ නිශ්ප්‍රභා කර ඇති බවය.

වසුදා ලවන්ගි ගුණසේන හෙවත් වසුදා ලවන්ගි ඥාණසිරි.

11-439

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව, කටුබැද්ද, රොලී ප්‍රනාන්දු මාවත, 1 වැනි පටුමග, අංක 12/14 දරන ස්ථානයෙහි පදිංචි සූරියබණ්ඩාරගේ විජිත නන්ද පෙරේරා (ජා.හැ.ප.අංක 662240354 V) වන මම, මා විසින් අත්සන් කරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ඩී. දල්පතාදු මහතා විසින් සහතික කරන ලද අංක 138 සහ 1994 ක්වූ සැප්තැම්බර් මස 23 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මාගේ ඇටෝර්නි බලකරු ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොරටුව, කටුබැද්ද, රොලී ප්‍රනාන්දු මාවත, 1 වැනි පටුමග, අංක 12/14 දරන ස්ථානයෙහි පදිංචි සූරියබණ්ඩාරගේ නිලන්ත පරාක්‍රම පෙරේරා නමැති අය එකී බල ඔප්පුවේ කාර්යයන් සඳහා මාගේ සත්‍යවූත් නීත්‍යානුකූලවූත් බලකරු වශයෙන් පත්කරන ලදී. වර්ෂ 2009 ඔක්තෝබර් මස 05 වැනි දින සිට මෙම නිවේදනය මගින් එකී සූරියබණ්ඩාරගේ නිලන්ත පරාක්‍රම පෙරේරා වෙත ප්‍රදානය කරන ලද්දා වූ ද, ප්‍රදානය කිරීම සඳහා අදහස් කරන ලද්දාවූ ද සියලු බලතල හා එමගින් ප්‍රදානය කරන ලද්දා වූ බලපුළුවන්කාරකම් ද වහාම ක්‍රියාත්මක වන පරිදි මා විසින් අවලංගු කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

ඇටෝර්නි බලකරු.

වර්ෂ ක් වූ 2010 ඔක්තෝබර් මස 27 වැනි දින දී ය.

11-381/1

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල, කටුබැද්ද දම්පෙ පාර, අංක 212 දරන ස්ථානයෙහි පදිංචි යමුනා රංගනී පෙරේරා (ජා.හැ.ප.අංක 657311588V) වන මම, මා විසින් අත්සන් කරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වසන්ත රණසිංහ මහතා විසින් සහතික කරන ලද අංක 1109 සහ 2002 ක්වූ ජූලි මස 04 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මාගේ ඇටෝර්නි බලකරු ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොරටුව, කටුබැද්ද, රොලී ප්‍රනාන්දු මාවත, 1 වැනි පටුමග, අංක 12/20 දරන ස්ථානයෙහි පදිංචි විරහැන්නැදිගේ රිචඩ් ෆ්ලෝරන්ස් ප්‍රනාන්දු (ජා.හැ.අංක 342831885V) නමැති අය එකී බල ඔප්පුවේ කාර්යයන් සඳහා මාගේ සත්‍යවූත් නීත්‍යානුකූලවූත් බලකරු වශයෙන් පත්කරන ලදී. වර්ෂ 2009 ඔක්තෝබර් මස 05 වැනි දින සිට මෙම නිවේදනය මගින් එකී විරහැන්නදිගේ රිචඩ් ෆ්ලෝරන්ස් ප්‍රනාන්දු වෙත ප්‍රදානය කරන ලද්දාවූ ද, ප්‍රදානය කිරීම සඳහා අදහස් කරන ලද්දාවූ ද සියලු බලතල හා එමගින් ප්‍රදානය කරන ලද්දාවූ බලපුළුවන්කාරකම් ද වහාම ක්‍රියාත්මක වන පරිදි මා විසින් අවලංගු කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

ඇටෝර්නි බලකරු.

වර්ෂ 2010 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින දී ය.

11-381/2

**දැනුම් දීමයි**

බත්තරමුල්ල පැලවත්ත තලංගම දකුණ අංක 5/941 (දැනට අංක 21 හියුග්ස් පැරේඩ් රිසවය(ර්), වික් 3073, ඕස්ට්‍රේලියාව) හි පදිංචි ජයතුංගගේ ශ්‍යාමලී සුභාෂිණී පෙරේරා වන මාගේ ඇටර්නි බලකරු ලෙස බත්තරමුල්ල, පැලවත්ත, තලංගම දකුණ, අංක 941 හි පදිංචි ජයතුංගගේ සයිමන් පෙරේරා පත්කරමින් ඩබ්ලිව්. ආර්. සී. ද සිල්වා, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 104 සහ 2008 අප්‍රේල් මස 26 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත්, ඒ මත මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කළ ජයතුංගගේ සයිමන් පෙරේරා මින් මතුවට මාගේ ඇටර්නි බලකරු ලෙස ක්‍රියා නොකරන බවත්, මින් මතුවට එකී ඇටර්නි බලපත්‍රය මත ඔහු කරනු ලබන කිසිදු ක්‍රියාවක් මාගේ ක්‍රියාවක් ලෙස නොසලකන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙමි.

ජයතුංගගේ ශ්‍යාමලී සුභාෂිණී පෙරේරා.

11-455

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී-කිරිබත්ගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංකය පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු එල්. කේ. සී. එන්. ඇපාසිංහ විසින් 2002 නොවැම්බර් මස 14 වැනි දින සාදන ලද අංක 2382 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරී පත්තුවේ මීගහවත්තෙහි පිහිටි සියඹලාගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 2A දරන, පර්චස් දහයයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.35) හෝ වර්ග මීටර් 261.8 විශාල ඉඩම, ගසකොළ, වගාවන් සහ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමග වේ.

රේඩියන්ට් ෆැන්සි හවුස් යන නාමය සහ විලාශයෙන් තනි ව්‍යාපාරයක් පවත්වාගෙන යන ශමින්ද ඉරෝෂන අතුකෝරළගේ ණයකරු හැටියට ද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, 2010 දෙසැම්බර් මස 10 වැනි දින පෙ.ව. 11.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.08.20 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2010.11.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද ලක්බිම සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- කොළඹ මහනුවර මාර්ගයේ කිරිබත්ගොඩ මංසන්දියට පැමිණ එතැනින් දකුණට හැරී මාකොළ හන්දිය දෙසට ගමන් කරන්න. එතැනින් වමට ඇති උඩුපිල පාරේ කි. මී. 6 ක් පමණ ගමන් කර දකුණට හැරෙන්න. අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහන් වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ කිරිබත්ගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, ජ්‍යෙෂ්ඨ උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 011-3144520.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 145, නුවර පාර,
කිරිබත්ගොඩ.
දුරකථන අංක : 011-2909954,
011-2909956.
ෆැක්ස් අංකය : 011-2909955.

11-536

### සෙලාන් බැංකුව පීඑල්සී - අනුරාධපුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුලු පළාත, උලගල්ල කෝරළේ, නාච්චදූව තුලාන කුසව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් මැන සාදන ලද 2002.05.03 දිනැති අංක 1069 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 3 ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද පර්චස් දහතුනයි දශම දෙකයි එකක් (අ. 0, රූ.0, පර්. 13.21) නොහොත් හෙක්ටයාර 0.0334 ක් විශාල ඉඩම සහ එහි පිහිටි වෙනත් සියලු දේත් වේ.

2. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ, කලාගම් පළාත මාමිනියා කෝරළේ, ඉහළ පුලියන්කුලම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් මැන සාදන ලද 2007.08.10 දිනැති අංක 2988 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මයිලගහවත්ත නමැති ඉඩමේ ලොට් 01 ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද රූඩ් එකයි, පර්චස් දහඅටයි දශම පහක් (අ.0, රූ.1, පර්. 18.5) නොහොත් හෙක්ටයාර 0.1480 ක් විශාල ඉඩම සහ එහි පිහිටි වෙනත් සියලු දේත් වේ.

මෙම දේපළ නාච්චදූව පදිංචි සරිෆ්දීන් ෆවුසුල් ජනෆ්දීන් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ වර්ෂ 2010 ක් වූ දෙසැම්බර් මස 10 වැනි දින පිළිවෙලින් පෙ.ව. 9.30 සහ ප. ව. 1.30ට එම දේපළ පිහිටි ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ප්‍රවේශය 1 .-* අනුරාධපුරයේ සිට නාච්චාදූව දක්වා කි. මී. 23ක් ගමන් කොට, මුස්ලිම් පල්ලිය පිටුපස ගුරු පාරේ මීටර් කිහිපයක් ගියතැන මෙම දේපළට ළඟාවිය හැකිය.

*ප්‍රවේශය 2.-* අනුරාධපුර සිට මරදන්කඩවල මාර්ගයේ කැකිරාව දෙසට යන විට මරදන්කඩවල කි. මී. 0.5 ක් මෙපිටින් මහපාරේ වංගුවේ ඇති ගුරුපාරෙන් වමට හැරී කි.මී. 2.5 ක් යන විට මෙම දේපළට ළඟාවිය හැකිය.

යෝජනා සම්මුති පිළිබඳ නිවේදනය සඳහා 2010.02.17 වැනි දින ඩේලි මිරර් සහ ලංකාදීප පුවත්පත් ද, 2010.02.24 දිනැති තිනක්කුරල් පුවත්පත ද 2010.02.26 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%) ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් සියයට එකක් (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2,000)ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03,
(දුරකථන අංක : 011-2456285, 2456284).

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12
දුරකථන අංක : 0777-378441,
0714-424478,
ෆැක්ස් අංකයඃ 0114-617059.

11-533

---

### මහජන බැංකුව - කතරගම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**01 පළමුවැනි වෙන්දේසියේ විකිණීම**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කෝරළයේ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට කතරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කඳසුරිඳුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දෙටගමුව නමැති ගමේ පිහිටි "දෙටගමුව හේන" නමැති ඉඩමෙන් මැන බෙදා වෙන් කර ගත් ඉඩමට 2005.09.12 වැනි දින බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක මහතා විසින් මැන සාදන ලද අංක M/805 දරන පිඹුරු පතේ පෙන්නුම් කරන කැබලි අංක 1 ලෙස නිරූපනය කර ඇති රූඩ් තුනක් (අක්. 0, රූඩ්. 3, පර්. 0) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියලු දේත් එකී ඉඩමට පිවිසීම පිණිස ඉහත පිඹුරුපතේ පෙන්නුම් කෙරෙන වැඩිහිටිකන්දට යන පාර දක්වා දිවෙන "පාර" ලෙස සලකුණු කළ කොටසේ මාර්ග අයිතිය ද සමග, මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2010.12.24 වැනි දින පෙ.ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2010.08.13 වෙනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2010.05.12 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* කතරගම නව නගරයේ සිට වැඩිහිටි කන්ද රණමයුර මාර්ගයේ කිලෝමීටර් 2 ක් පමණ ගිය පසු හමුවන සම්පත් ලීමෝලට යාබදව මෙම දේපළ හමුවේ. ප්‍රවේශ බාධක නොමැත. වාහනයකින් ප්‍රවේශ විය හැකිය.

### 02 දෙවැනි වෙන්දේසියේ විකිණීම

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කෝරළයේ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට කතරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ දෙටගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කතරගම නමැති ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක මහතා විසින් මැන සාදන ලද 2005.08.20 දිනැති අංක M 679 දරන පිඹුර පතේ පෙන්නුම්කරන ලොට් අංක 1 වශයෙන් බෙදා වෙන් කොට නිර්ණය කර සළකුණු කරන ලද රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 01. පර්. 20) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි පහයි දෙකක් (හෙක්. 0.152) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලු දේත් මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2010.12.24 වන දින ප.ව. 12.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.- 2009.11.20 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2010.05.12 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් යන පුවත්පත්වල පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*.- කතරගම මහජන බැංකු ශාඛාවේ සිට තිස්ස මාර්ගයේ කි. මී. 1/4 පමණ ගිය පසු හමුවන "චන්දන රෙස්ට්" හෝටලය අසලින් වම් පසට ඇති වැඩිහිටි කන්ද මාර්ගයේ කි. මී. 1/4 ක් පමණ ගිය පසු මාර්ගයට යාබදව දකුණු පසින් මෙම දේපල හමුවේ. ප්‍රවේශ බාධක නොමැත. වාහනයකින් ප්‍රවේශ විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් පාලන ආයතනයට 01%,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදලද විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ,
6. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මොණරාගල, වැල්ලවාය පාරේ පිහිටි මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර තුමා වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 055-2277105/055-2276347
ෆැක්ස් අංකය : 055-2276351

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් ඒවනවිටත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සාමවිනිසුරු, ඩබ්. ජයතිලක,
උසාවි කොමසාරිස්,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 48/1, කළුගල්පිටිය,
බදුල්ල.
දුරකථන අංක : 055-2230846,
072-3438130.

11-379

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/72722/වයි18/894.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.08.20 *ගැසට් පත්‍රයේ* සහ 2004.11.22 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හ යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මයා, විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2010.12.06 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවේ හෙට්ටිපොළ පිහිටි මීගහමුලහේන්යාය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි. එම්. ඒ. යාපා විසින් සැකසූ 1985.12.31 දින හා අංක 1873 දරන පිඹුරේ 1998.02.24 දිනැති උප බෙදුම් සටහන අනුව කැබලි අංක 2 ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 31 ක් වූ බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද එකී පිඹුරේ දක්වා ඇති කැබලි අංක 2 සී මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 841/264 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 04 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-583/2

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/46519/එෆ්6/446.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.03.26 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2010.05.24 වැනි දින

දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකරගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කැස්බෑව, වලව්වත්ත, ධම්මිකා, අංක 228/ඒ හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මයා, විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.12.07වෙනි දින පෙරවරු 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ හිරණ සහ ගල්තුඩේ පිහිටි රත්නගිරිය වත්ත නමැති ඉඩමට 1993.11.14 සහ 1993.12.19 දින බලයලත් මිනින්දෝරු ජේ. එන්. වික්‍රමරත්න විසින් මැන සකසන ලද අංක 170 දරන පිඹුරේ කැබලි අංක 16 බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 14.25 ක් වූ බිම් කොටස. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 273/283 යටතේ ලියාපදිංචි වී ඇත.

සී. ඩබ්. ඩී. නෙයිස් මානක තැනගේ අංක 448 හා 1961.12.27 දින දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක ඒ. සී. සහ ඩී මතින් සහ ඉහත කී අංක 170 පිඹුරේ දැක්වෙන කැබලි අංක 10 යන කැබලි මතින් මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 04 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-583/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/55808/ඉසෙඩ්18/887, 18/59363 /වයි 18/212.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.06.06 *ගැසට් පත්‍රයේ* සහ 2005.08.13 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.12.03 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොහාන - දමුණුගල ග්‍රාමයේ පිහිටි කොහාන සඳගල ජනපදය *නොහොත්* කොහාන දමුණුගල ජනපදය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එන්. අබේසේකර විසින් සකසන ලද 1994.06.26 දින හා අංක 110/94 දරන පිඹුරේ කැබලි අංක 80 ඒ ලෙස දක්වා ඇති (මෙය අංක ඒ 1201 දරන පිඹුරේ කැබලි අංක 80 හි නැවත මිණුමකි) ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, පර්. 21 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ් 15/6818/96 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද එකී අංක 1 10/94 දරන පිඹුරේ සඳහන් මාර්ග අයිතියද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 නොවැම්බර් මස 04 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-583/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

බණ්ඩාරගම කිදෙල්පිටියෙහි පිහිටි මිල්ලගහලන්ද නැමැති ඉඩමට බලයලත් මානක ඒ. පී. දැරනියගල විසින් මැන සාදන ලද 1992.05.05 දින සහ අංක 725 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 3 දරන කොටස ප්‍රමාණය පර්චස් විසි පහයි දශම හත (අ.0 රූ.0 පර්.25.7)

*පිවිසීම.-* කැස්බෑව නගරයේ සිට බණ්ඩාරගම දක්වා යන මාර්ගයේ කි. මී. 4.5 ගමන් කිරීමේදී (17 වැනි කි. මී. කණුව පසුකොට මීටර් 100 ගමන් කිරීමේදී) වම් පැත්තට ඇති අඩි 10 පළල පාරේ ඉදිරියට ගමන් කිරීමේදී මෙම දේපල පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.02 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද හා 2009.10.08 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. සියලුම ප්‍රචාරක වියදම්
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ආයතන ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661826, 2661835 ගෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 071-4175944 - 075-8489378.

11-555

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අම්බලන්ගොඩ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. ඒ ද සිල්වා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියන ලද්දා වූ ද 2007.03.24 වැනි දින සහ අංක 1684 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලංදාරි දේව අසිත ධනවංශ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා අති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2010 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින ප.ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබොඩ පත්තුවේ මාදම්පේ ඌරවත්ත හි පිහිටි අලගියදූරවත්ත හෙවත් ඔලබොඩවත්ත නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. වී ගුණවර්ධන විසින් මැන සාදන ලද 1992.07.18 වැනි දින සහ අංක 10 ඒ දරන කොටස ප්‍රමාණය පර්චස් දොළහයි දශම තුනයි හය (අ.0 රූ.0 පර්.12.36)

*පිවිසීම .-* ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ අම්බලන්ගොඩ නගරයට මීටර් 100 පමණ නුදුරින් ඌරාවත්ත පාළම අසල මෙම දේපල පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2010.09.17 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද හා 2010.09.20 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,

3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු සහ තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661826, 2661835 ගෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 99 උසාවිය පර
කොළඹ 12.
දුරකථන අංක : 071-4175944 - 075-8489378.

11-556

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ බියන්විල ග්‍රාමයේ පිහිටි "මකුළුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 2008 ජූනි 03 වැනි දාතම හා අංක 3150 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 3A1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : 3A2 නැගෙනහිරට : අංක 6347 දරණ පිඹුරේ ලොට් 5 (අඩි 12 පළල පාර) දකුණට : අංක 2982 දරන පිඹුරේ ලොට් 3B සහ බස්නාහිරට : අංක. 12057 දරණ පිඹුරේ ලොට් 2 සහ 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ : 0 රූ : 0 පර් : 10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක, 3150 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව සී 881/234 හි යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩී. ඒ. එන්. කුමාර,
ගිණුම් අංක : 1005 5306 2464.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 ක් වූ අගෝස්තු මස 04 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පහළොස් ලක්ෂ දෙදහස් හත්සිය පනස් හයයි ශත හතක (රු. 15,02,756/07) මුදලද 2010 අප්‍රේල් 22 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ තුන් ලක්ෂ හැට දහස් තුන්සිය හතළිස් දෙකයි ශත හැත්තෑ තුනක (රු. 13,60,342/73) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිතුනක් (23%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.10.15 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.09.28 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ 2010.09.27 වැනි දින "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.09 දින ප. ව. 3.30 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව් ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. එච්. ඩී. ගුණසේකර,
ගිණුම් අංක : 0075 5000 0401.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 ක් වූ අගෝස්තු මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිහය ලක්ෂ හැත්තෑ හය දහස් එකසිය තිස්අටයි ශත හතළිස් හතරක (රු. 26,76,138/44) මුදලද 2008 මාර්තු 18 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිහතර ලක්ෂ හතළිස් හය දහස් නමසිය හැත්තෑ හතයි ශත අසූතුනක (රු. 24,46,977/83) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොලියද, හා ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.07.31 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2009.07.20 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.10 වැනි දින ප.ව. 3.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, වාද්දුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (පානදුර උප කාර්යාලයේ) උතුරු තල්පිටිය පිහිටි මැද පටුමග වරිපනම් අංක 19/ඒ දරන "ලොට් 2බී1 හී දොඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. ආර් ජයසේකර යන අය විසින් සාදන ලද 2001 නොවැම්බර් 30 දාතම හා අංක 2672 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් සී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : ලොට් ඩී (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම) නැගෙනහිරට : පිඹුරු අංක 2672 හි ලොට් බී දකුණට : පිඹුරු අංක 9507 හි ලොට් 2 බී 2 සහ බස්නාහිරට : පිඹුරු අංක 3059 හි ලොට් 8 දැනට මැද පටුමග සහ පිඹුරු අංක 3059 හි ලොට් 2ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම අටයි බිංදුවක් (අ : 0 රූ : 0 පර් : 12.80) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක, 2672 ට අනුව වෙළුම/පත්ඉරුව එෆ් 521/205 හී පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

නම : ඩී. සසිදරන්,
ගිණුම් අංක : 0027 5001 1716.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 ක් වූ මාර්තු මස 13 වැනි දින සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 364 හා 2011 ප්‍රකාර රුපියල් පන් ලක්ෂ හැට නම දහස් හත්සිය අනූවයි ශත දාහතරක (රු. 5,69,790/14) මුදලද 2009 ජනවාරි 29 දින සිට අංක 364 හා 2011 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ දා හත් දහස් දෙසීය අසූ දෙකක (රු. 5,17,282) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළියද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.11.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ, 2009.11.18 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.09 වැනි දින ප.ව. 1.30 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව් ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, දැන් කොළඹ දිස්ත්‍රික්කය තුළ, ගම්පහ දිස්ත්‍රික්කයේ අදිකාරි පත්තු සියනෑ කෝරලේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභා කැළණිය උප කාර්යාල සීමාව තුළ වනවාසල හි පිහිටි ගල්මන්ගොඩවත්ත පාර වරිපනම් අංක 70/බී දරන "ගල්මන්ගොඩවත්ත හෙවත් අඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩී. ජේ. වී. පෙරේරා යන අය විසින් සාදන ලද 1986 මැයි 28 දාතම හා අංක 8996 දරන පිඹුරෙහි අංක 03 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : ලොට් 1 නැගෙනහිරට : ලොට් 2 දකුණට : පාර සහ ලොට් 5 සහ බස්නාහිරට : ලොට් 05 සහ 04 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අ : 0 රූ : 0 පර් : 11) විශාල ඉඩම් කොටස සමග සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක, 8996 ට අනුව වෙළුම/පත්ඉරුව සී 469/302 හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වනවාසල හි පිහිටි "ගල්මන්ගොඩවත්ත හෙවත් අඹගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩී. ජේ. වී පෙරේරා යන අය විසින් සාදන ලද 1986 මැයි 28 දාතම හා අංක 8996 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් අංක 05 (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට ලොට් 04 සහ 03 නැගෙනහිරට : ලොට් 03 දකුණට : පාර සහ කේ. බාලසුබ්‍රමනියම්ගේ ඉඩම සහ බස්නාහිරට : එන්. එන්. කරුණාරත්නගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම හයයි පහක් (අ : 0 රූ : 0 පර් : 3.65) විශාල ඉඩම් කොටස එකී පිඹුරු අංක, 8996 ට අනුව වෙළුම/පත්ඉරුව සී 500/290 හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/2

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

නම : බී. ඩබ්ලිව්. එල්. සිල්වා
ගිණුම් අංක : 0080 5000 0096

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 ක් වූ අගෝස්තු මස 04 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි දෙලක්ෂ පන් දහස් එකසිය විසි හතයි ශත අසූ හතරක (රු. 2,205,127/84) මුදලද 2010 මාර්තු 09 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහනවයක් (19%), රුපියල් තුන් ලක්ෂ අනූ දහස් නමසිය හැත්තෑ තුනයි ශත දහයක (රු. 3,90,973.10) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) හා තවත් රුපියල් අට ලක්ෂ විසි හත් දහස් හතලිස් අටයි ශත හැත්තෑ එකක් (රු. 8,27,048/71) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද හා ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.10.15 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.09.16 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ "තිනකුරල්" අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.14 වැනි දින ප.ව. 3.30 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව් ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරලේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් - දික්ඔය නගර සභා සීමාවන් තුළ හැටන් හි පිහිටි "හැටන් එස්ටේට් හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. එල්. ඩී. ඒ. විජේවර්ධන යන අය විසින් සාදන ලද 1995 අගෝස්තු මස 31 දාතම හා අංක 7446 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : දිඹුල්ල 2 වෙනි ඉඩම සහ ලොට් 2 නැගෙනහිරට : ලොට් 2 සහ දිඹුල්ල 2 වෙනි ඉඩම දකුණට : දිඹුල්ල 2 වෙනි ඉඩම සහ බස්නාහිරට : දිඹුල්ල 2 වෙනි ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම බිංදුවයි දෙකක් (අ : 0 රූ : 0 පර් : 8.02) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක, 7446 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 75/39 යටතේ ගම්පල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/8

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

නම : එම්. ඒ. ටී. ආර්. ද සිල්වා සහ එම් ඒ. එස්. ද සිල්වා
ගිණුම් අංක : 1025 5007 4645

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ක් වූ ජනවාරි මස 25 වැනි දින සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දස ලක්ෂ හතලිස් හතර දහස් දෙසිය තිස් හතරයි ශත අසූ පහක (රු. 10,44,234/85) මුදලද 2006 නොවැම්බර් 08 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ අනූ හය දහස් හතලිස් අටයි ශත පනස් නමයක (රු. 7,96,048/59) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ පොළිය ද, හා දැන්වීම් ගාස්තු ද ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.08.13 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2007.06.22 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.07 වැනි දින ප.ව. 2.00 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව් ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහ නගර සභා සීමාවන් තුළ දැන් වරිපනම් අංක 170 දරන නාගොල්ල හි පිහිටි මොයිසේ ක්‍රෙසන්ට් කොට්ඨාසයෙන් (කටුවේගෙදර එස්ටේට් හි කොටසක්) මාතලේ බලයලත් මානක තැන එස්. රංචාගොඩ යන අය විසින් සාදන ලද 1985 නොවැම්බර් 09 දාතම හා අංක 1428 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 2 වශයෙන් නිරූපිත ඉඩම් කොටසට මායිම් : උතුරට : එකී පිඹුරේ ලොට් 1 නැගෙනහිරට : මහ නගර සභා පාර, වරිපනම් අංක 168 දරන එම ඉඩමේ ඉතිරි කොටස දකුණට සහ බස්නාහිරට : මහ නගර සභා පාර සහ මහ නගර සභා 2 වෙනි මාර්ගය, ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම දෙකයි පහක් (අ : 0 රූ : 0 පර් : 26.25) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1428 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 107/188 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/7

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

නම : ජී. ආර්. ජී. ගොඩගමගේ
ගිණුම් අංක : 0007 5010 3081

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අසූ ලක්ෂ අට දහස් දෙසිය හැත්තෑ අටයි ශත දහ අටක

(රු. 8,08,278/18) මුදලද 2009 නොවැම්බර් 27 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ විසි දහයක (රු. 5,20,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.05.26 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.05.18 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.06 වැනි දින පෙ.ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ දුම්බර කෝරළේ උඩුගම්පහ පත්තුවේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අතරගල්ල මැදගම්මැද්දේ ග්‍රාමයේ පිහිටි "සියඹලාවේ වත්ත නොහොත් වටගොඩයේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. කේ. අබේසුන්දර යන අය විසින් සාදන ලද 1998 මැයි 16 දාතම හා අංක 897 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කේ. ආර්. රණසිංහ යන අයට අයිති එම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : කේ. ආර්. දසනායක යන අයට අයිති එම ඉඩමේ ඉතිරි කොටස දකුණට : මහරතැන්න මල්පාන පාර (ගම් සභා පාර) සහ බස්නාහිරට : කේ. ආර්. බෝධිපාල යන අයට අයිති සෙයද්දුරගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම හතයි පහක් (අ : 0 රූ : 0 පර් : 14.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 897 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 785/193 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ දුම්බර කෝරළේ උඩුගම්පහ පත්තුවේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අතරගල්ල මැදගම්මැද්දේ ග්‍රාමයේ පිහිටි "සියඹලාවේ වත්ත නොහොත් වටගොඩයේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ඩබ්ලිව්. ආරියසේන යන අය විසින් සාදන ලද 1973 ජනවාරි 16 දාතම හා අංක 1664 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කාට සීමා නිර්ණයකොට ලොට් 4 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එකී පිඹුරේ ලොට් 3 ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 1 ද, දකුණට : ගම් සභා පාර සහ බස්නාහිරට : සෙයද්දුරගේවත්ත වෙන්කරන පැල ඉණි වැට සහ කොඩිතුවක්කුගෙදර බෝධියගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම හතයි පහක් (අ. 0 රූ. 0 පර්. 14.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙන්ත අයිතීන් ද වරප්‍රසාදයන්, ප්‍රවශතාවන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1664 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/6

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එස්. එස්. එම්. වික්‍රමසුරේන්ද්‍ර
ගිණුම් අංක : 1004 5014 7502

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ක් වූ ජුනි මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑ එක් දහස් හයසිය පනස් හතරයි ශත හැත්තෑ අටක (රු.11,71,654/78) මුදල ද 2007 අප්‍රේල් 24 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දස ලක්ෂ අසූ පන් දහස් තුන්සිය දහ තුනයි ශත තිස් පහක (රු. 10,85,313/35) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොලහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.02.26 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.02.17 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ " තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.24 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ අඹතලෙන් පහල කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වෝඩ් අංක 04 ගොතටුව පිහිටි වරිපනම් අංක 104/25 "බටලන්දහේන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. වික්‍රමසිංහ යන අය විසින් සාදන ලද 1990 මාර්තු 07 දාතම හා අංක 1121 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 7ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : අංක PPCo. 607 දරන පිඹුරේ ලොට් 6 ද, නැගෙනහිරට : බී. විලියම් පෙරේරා සහ වෙනත් අයගේ හල්ගහවෙල කුඹුර දකුණට : අංක 1121 දරන පිඹුරේ ලොට් 7බී සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ : 0 රූ : 0 පර් : 8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1121 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 962/40 හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

සර්වේයර් ජනරාල් විසින් සාදන ලද 1969 ඔක්තෝබර් 10 දාතම හා අංක PPCo. 607 දරන පිඹුරේ නිරූපිත ලොට් 15 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/5

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ටී. ප්‍රනාන්දු සහ ජේ. ඒ. ඩී. ආර්. ජේ. කුමාර
ගිණුම් අංක : 1108 5340 7980

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 ක් වූ අගෝස්තු මස 04 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පහළොස් ලක්ෂ දහතුන් දහස් විසි පහයි ශත හය (රු. 15,13,025/06) මුදල ද 2010 මැයි 18 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහ තුන් ලක්ෂ පනස් දහස් හාරසීය අනූ දෙකයි ශත හැත්තෑ හතක (රු. 13,50,492/77) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිතුනක් (23%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.10.15 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.09.24 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ " 2010.09.23 දින තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.10 වැනි දින ප.ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ (හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ) උතුරු පිටිගල් කෝරළේ මුන්නේස්සරම් පත්තුවේ හලාවත ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මුගුනුවටවන ග්‍රාමයේ පිහිටි "මුගුනුවටවන වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන එම්. එම්. ජී. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2008 ජුනි 03 දාතම හා අංක 6103A දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා පාර (අඩි 20 පළල), නැගෙනහිරට : නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා - බලයලත් මානක තැන ඒ. ජී. එස්.බී. පරාක්‍රම යන අය විසින් සාදන ලද 1990 අගෝස්තු 15 දාතම හා අංක 1169 දරන පිඹුරේ ලොට් 36, දකුණට : බලයලත් මානක තැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම යන අය විසින් සාදන ලද 1990 අගෝස්තු 15 දාතම හා 1169 දරන පිඹුරේ ලොට් 12 සහ බස්නාහිරට : බලයලත් මානකතැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම යන අය විසින් සාදන ලද 1990 අගෝස්තු 15 දාතම හා අංක 1169 දරන පිඹුරේ ලොට් 11 යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ : 0 රූ : 0 පර් : 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6103 A දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

එකී මුගුනුවටවන ග්‍රාමයේ පිහිටි "මුගුනුවටවන වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම යන අය විසින් සාදන ලද 1990 අගෝස්තු 15 දාතම හා අංක 1169 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 16 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 36 - පාර සඳහා වෙන්කිරීම, නැගෙනහිරට : ලොට් 36- පාර සඳහා වෙන්කිරීම, දකුණට : ලොට් 12 සහ බස්නාහිරට : ලොට් 11 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 1169 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව සී 193/148 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-581/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ආර්. එම්. ආර්. රත්නායක
ගිණුම් අංක : 0090 5000 0173

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 ක් වූ ජුනි මස 24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට පන් ලක්ෂ නම දහස් හයසිය හැට එකයි ශත එකක (රු. 65,09,661/01) මුදල ද 2010 අප්‍රේල් 08 දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් නම ලක්ෂ අනූ එක් දහස් පන්සිය දෙකයි ශත එකොළහක (රු. 59,91,502/11) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිහතරක් (24%) බැගින් වූ පොලිය ද, හා දැන්වීම් ගාස්තු ද ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වේනොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.08.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.08.09 වැනි දින "දිවයින", "අයිලන්ඩ්", සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2010.12.07 වැනි දින පෙ.ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව් ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු කෝරළේ වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පාදෙණිය ග්‍රාමයේ පිහිටි "දෙමළිදවපුයාය හි කොටසක්" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එම්. අනුරරත්න යන අය විසින් සාදන ලද 2005 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 4579 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 05 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඒ. ජී. එස්. බාලකුමාරි යන අයගේ දෙමළිදවපුයාය දේපළ නැගෙනහිරට : කුරුණෑගල සිට දඹුල්ල දක්වා මහා මාර්ගය, දකුණට : බී. එම්. සෝමරත්න සහ වෙනත් අයට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : පැල ඉණි වැට සහ කිරිමැණිකා යන අයගේ වරයාය දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන්

රූඩ් තනක් (අ : 0 රූ : 3 පර් : 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4579 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 506/87 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-582/6

---

### සෙලාන් බැන්ක් පීඑල්සී - මාතලේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ යෝජිත කුරුණෑගල - දඹුල්ල අධිවේගී මාර්ගයට නුදුරුව ඉබ්බන්කටුව ගමේ පිහිටි නයිගලවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද 2004.09.05 වැනි දිනැති අංක 2548 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ(A) සහ ලොට් බී (B) නමැති ඒකාබද්ධ ඉඩම් කැබලි දෙක සහ එහි පිහිටි ගොඩනැගිලි, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ.
ඉඩමේ ප්‍රමාණය ලොට් ඒ - අක්කර 02, රූඩ් 01, පර්. 30, ලොට් බී - අක්කර 06, රූඩ් 03, පර්. 28
(මුළු ප්‍රමාණය අ. 09, රූ. 01, පර්. 18)

මෙම දේපළ, මහරගම සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන මෙසස් සඳලංකා ඩේරි ෆාම්ස් (පීවීටී) ලිමිටඩ් සහ මහරගම පදිංචි බස්තියන් ගමගේ සමන්ත රසත් සිල්වා සහ බස්තියන් ගමගේ එඩ්වින් සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම*.- දඹුල්ල නගර මධ්‍යයේ සිට කුරුණෑගල මහාමාර්ගයේ කි. මී. 3.5 ක් පමණ 87 වැනි කි. මී. කණුව දක්වා ගමන් ගත් විට මහා මාර්ගයේ වම් පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2010 ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.01.23 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2009.01.17 වැනි දින ඩේලිමිරර්, ලංකාදීප සහ 2009.01.29 වැනි දින වීරකේසරී යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකක්), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී සෙලාන් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැන්ක් පීඑල්සී සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701284, 011-2456285 011-2456284

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් අංකය : 081-2211025.

11-436

---

### නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

**නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී වෙත උකස් කරන ලද වටිනා දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ වැලිසර සහ නාගොඩ ගම්වල පිහිටි බදුල්ලගහකුඹුර, තිඹිරිගහවලකුඹුර, නුගවලකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 4256 සහ 2004.08.02 දින දරන පිඹුර ප්‍රකාර ලොට් 14 දරන බෙදා වෙන් කළ පර්චස් නවයකුත් දශම හයයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 9.60) ක විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියලු දේත් මාර්ග අයිතිවාසිකම් ද සමගය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 609/195 දරන වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද අංක 850 සහ 2007 දෙසැම්බර් මස 27 දින දරන උකස් බැඳුම්කරය මත ඉහත කී දේපළ නුගේගොඩ, පැපිලියාන පාරේ, අංක 41/5 දරන ස්ථානයේ පදිංචි ඉන්දික කුරේ වනිගරත්න යන අය විසින් ඉහත කී බැංකුවට උකස් කරන ලදුව ඔහු විසින්, ඉහත කී උකස් බැඳුම්කරය මත ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින් ඉහත කී බැංකු විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, 2010.12.10 වැනි දින පෙ.ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අධ්‍යක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා 2009.06.12 වැනි දින *ගැසට් පත්‍රය* සහ 2009.06.12 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් ගෙවීම් කළ යුතුය:-

1. ගැණුම් මිලෙන් 10% ක් (ගැණුම් මිලෙන් ඉතිරි 90% සහ ගැණුම් මිල මත අයවිය යුතු ව්‍යවස්ථාපිත හා අනෙකුත් සියලු බදු සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.)

2. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාළ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වේ,
3. ගැණුම් මිලෙන් 2.5% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය,
4. ප්‍රචාරක ගාස්තුවලින් 50% ක් ගෙවිය යුතුය,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 500 යි,
6. නොතාරිස් ගාස්තුව රු. 2,500 යි.

හිමිකම් ඔප්පු සහ වෙනත් ලියවිලි කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවතේ, අංක 256 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ දී පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 011-4682403, 077-3918733.

එන්. ඩී. ඩී. පී. සේනානායක,
ට්‍රියැඩ් ඔක්ෂනියර්ස්.

අංක 155/1, දෙහිවල පාර,
බෙල්ලන්විල.
දුරකථන අංකය : 011-2731317.

11-551

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දංකොටුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා දංකොටුව ඔතර දකුණ උප කාර්යාල සීමාව තුළ මොහොට්ටිමුල්ල ගමේ පිහිටි සරත්චන්ද්‍ර එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ඒ. සිරිසේන විසින් 2003.09.18 වැනි දින අංක 2677 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 1 ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : අක්කර 04, රූඩ් 03, පර්. 21.01.

මෙම දේපළ චක්‍රවර්තිගේ රන්ධීර උදේශ් කුමාර ප්‍රනාන්දු ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.*-දංකොටුව නගර මධ්‍යයේ සිට පන්නල පාරේ කි. මී. 2 1/4 ක් පමණ ගමන් ගෙන (හෙලිකොප්ටර් හාඩ්වෙයාර් ව්‍යාපාරයට යාබදව) වමට හැරී මොහොට්ටිමුල්ල පාරේ කි. මී. 01 ක් පමණ ගමන් ගෙන (සුසාන භූමියට යාබදව) දකුණට හැරී තාර පාරේ මීටර් 300 ක් පමණ ගොස් දකුණු දෙසින් හමුවන බොරළු පාරට හැරී මීටර් 100 ක් පමණ ගිය පසු මෙම පාරේ දකුණු දෙසින් අදාළ දේපළ පිහිටා තිබේ. (CMD ෆැක්ටරි යන නමින් හඳුන්වන ලද ඉඩම).

2010 ක් වූ දෙසැම්බර් මස 10 වැනි දින ප.ව. 1.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.10.23 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2009.10.26 දින, ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :-

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර,
දුරකථන අංක : 081-2211025/071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

11-435

---

## සෙලාන් බැන්ක් පීඑල්සී - කිරිබත්ගොඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දේපළක් කැළණිය ප්‍රාදේශීය සභා දළුගම උප කාර්යාල සීමාවන් තුළ ඊරියවැටිය ගමේ ලුම්බිණි මාවතේ පිහිටි මාරගහවත්ත අළුබෝගහකුඹුර කජුගහකුඹුර සහ ඕවිට නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඒ. කටුගම්පොල විසින් 1999.08.08 වැනි දින අංක 81/1999 දරන සැලැස්මේ පෙන්නුම් කරන බෙදා වෙන් කරන ලද ලොට් 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනිකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 14 යි.

*දේපළට පිවිසීම.*- කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ කිරිබත්ගොඩ දක්වා ගමන් ගෙන නව හුණුපිටිය පාරට හැරෙන්න. මෙම පාරේ මීටර් 900 ක් පමණ ගමන් ගත් විට දකුණු දෙසින් ලුම්බිණි පටුමග හමු වේ. මෙම පටුමගට හැරී මී. 100 ක් පමණ ගමන් ගෙන දකුණට පිහිටි පටු පාරට හැරී මී. 100 ක් පමණ ගමන්ගත් විට මෙම පාරේ අවසානයේ අදාළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ සියලු දෙනාම කැළණිය හි පදිංචි බෝධිය බදුගේ ඇන්ටන් ටෙස්නි පෙරේරා, කහනවිට ලියනගේ දෝන චාමිලා තුෂානි සහ හෙට්ටියාදුර මොරින් ප්‍රියංගා සඳමාලි ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2010 ක් වූ දෙසැම්බර් මස 09 වැනි දින ප.ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.03.19 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2009.11.27 දින ඩේලිමිර්ර්, ලංකාදීප සහ 2010.01.04 දින තිනකුරල් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය ඃ-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න ඃ සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැන්ක් පීඑල්සී, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03,

දුරකථන අංක ඃ 011-2456280/011-2456285.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක ඃ 081-2211025/071-4755974, ෆැක්ස් අංකය ඃ 081-2211025.

11-437

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.